# 2.22 පුරාතන දකුණු ආසියාවේ රාජ්‍ය බලය කෙරෙහි පැවති සීමා

ආචාර්ය ඒ.එච්.එම්.එච්. අබයරත්න
ඉතිහාස අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය.

## ABSTRACT

මෙම අධ්‍යයනයේ පරමාර්ථය වූයේ පුරාතන දකුණු ආසියාවේ රාජ්‍ය බලය වර්ධනය කිරීමට ඉවහල් වූ සාධක සහ රාජ්‍ය බලයට සීමා පැනවූ සාධක පරීක්ෂා කිරීම යි.

භාරතීය සංස්කෘතිය ව්‍යාප්ත වූ ප්‍රදේශවල රජවරුන්ට අසීමිත බලයක් ආරෝපණය කර තිබෙනු දක්නට ලැබේ. මෙම තත්ත්වය වඩාත් වර්ධනය වූ පසු රජු දේවත්වයට පත් කරනු දැකිය හැකි ය. ඇතැම් විට රජු දෙවියන් ම ලෙසත්, නැතහොත් විවිධ දෙවිවරුන්ගේ ශරීරාංගවල බලය රජුට ආරෝපණය වන බවත් විශ්වාස කෙරිණි. විශේෂයෙන් ම රාජසූය යඥය වැනි යාගවලින් මෙම තත්ත්වය විදහා දැක්විණ. ශ්‍රී ලංකාවේ ද ඇතැම් රජුන් කිසියම් ආකාරයකින් දෙවියන් හා සමාන බවක් දැක්වීමට උත්සාහ දරා තිබේ.

මෙහිදී පර්යේෂණ ගැටලුව වශයෙන් හඳුනාගනු ලැබුවේ ඉහත සඳහන් තත්ත්වය සැබැවින් ම ප්‍රායෝගිකව ක්‍රියාත්මක කළ හැකිවූයේ ද යන්නයි.

ඉහත දැක්වූ පරිදි රජුට අසීමිත බලයක් පවරනු ලැබුව ද ඔහුට අත්තනෝමතිකව ක්‍රියා කිරීමට හැකියාවක් නොවී ය. එයට හේතු වූයේ විවිධ ක්‍රමවේද මගින් රජුගේ බලය සීමා කිරීම යි. මෙහිදී ආගමික සංකල්ප, විවිධ රාජ්‍ය නිලධාරීන්, ඇතැම් සමාජ සංස්ථා ආදිය මගින් රාජ්‍ය බලය සීමා වී තිබූ ආකාරය භාරතීය මූලාශ්‍රය මගින් ද ශ්‍රී ලාංකීය මූලාශ්‍රය මගින් ද තහවුරු කරගත හැකි ය.

මෙහිදී උපයෝගී කරගනු ලැබූ පර්යේෂණ ක්‍රමවේදය වූයේ ප්‍රාථමික මූලාශ්‍රය ගැඹුරින් පරීක්ෂා කිරීම මගින් නිගමනවලට එළඹීම යි.